# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,111 — 1960 අප්‍රේල් 22 වැනි සිකුරාදා — 22.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 287 | තොටුපල් ඡේද්ද හා වෙනත් ඡේද්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 291 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 291 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ඔඩු බෑහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 298 |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ජෙව්ල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු නීතිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බැර කැනීම් පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම් සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් සෑම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහළ භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ,

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

සංලක්ෂ්‍යය.—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබූවෝ වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. අවශ්‍ය සුදුසුකම්.—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදාතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව— රත්මලානේ ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගේ අංශය

ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගේ අංශයේ දෙවැනි ශ්‍රේණියේ (තාවකාලික) සැලසුම්කරු තනතුරු දෙකක් සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

2. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයෙහි, අපේක්ෂකයෝ වයසින් අවුරුදු 21 ට නොඅඩු, අවුරුදු 40 ට නොවැඩි, මේ සුදුසුකම් ඇති වග තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ හැකි අය විය යුත්තාහ :

(අ) හොඳ පොදු අධ්‍යාපනයක් ලබා ඇති බව,

(ආ) (යාන්ත්‍රික ඉන්ජිනේරු ශිල්පය, විදුලි ඉන්ජිනේරු ශිල්පය, නිර්මාණක ඉන්ජිනේරු ශිල්පය හෝ ඒ සමාන හෝ එයට උසස් හෝ විභාගයක් ආදී වශයෙන්) ලංකා කාර්මික විද්‍යාලයේ ඉන්ජිනේරු ඩිප්ලෝමා උපාධියක් සඳහා අවසාන පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යය ලබා ඇති බව, හෝ

(ඇ) ඉන්ජිනේරු වෙළඳ සමාගමක තුන් අවුරුද්දකට වැඩි කාලයක් සැලසුම්කරුවෙකු වශයෙන් සේවය කර ඇති බව, හෝ

(ඈ) ((අ) යටතේ මුලින් දැක්වූ) ලංකා කාර්මික විද්‍යාලයේ ඉන්ජිනේරු ශිල්පය පිළිබඳ තුන් අවුරුදු පාඨ මාලාවකට අදාළ පරීක්ෂණ දෙකකින් සාමාර්ථ්‍යය ලබා, ඉන්ජිනේරු සැලසුම්කරුවෙකු වශයෙන් සෑහෙන පළපුරුද්දක් ඇති බව.

3. වර්ෂයකට රු. 1,260—120—රු. 3,780 (කා. ක. රු. 2,820 පෙර) පඩි ක්‍රමය අනුව සුදුසුකම් හා පළපුරුද්දක් අනුව සෑහෙන පඩියක් පත්වීමේදී නියම කැරේ. ධුරය තාවකාලික, විශ්‍රාම වැටුප් රහිත වූවකි.

4. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආකෘතිය අනුව 1960.5.13 වැනි දින ප.ව. 4ට පෙර ලැබෙන පරිදි මරදානේ, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර දුම්රිය දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට ඉදිරිපත් නොකළ යුතුය.

5. සම්මුඛ පරීක්ෂණයක් සඳහා තමන්ගේම වියදමෙන් මරදානේ, ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, සාමාන්‍යාධිකාරිගේ කායසීලයට අවශ්‍යවූ විට පැමිණීමට අපේක්ෂකයෝ සූදානම්ව සිටිය යුත්තාහ.

6. රත්මලානේ, ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගෙන් ඉල්ලා යවා වැඩි විස්තර ලබාගත හැකිය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වෙනි ඡේදයේ මුල පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසිවලට අවධානය යොමු කැරේ.

බී. ඩී. රම්පාල,
සාමාන්‍යාධිකාරී.

1960 අප්‍රියෙල් 11 වැනි දා,
තැපැල් පෙට්ටිය අංක 355,
කොළඹ.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**රත්මලානේ, ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරුතැනගේ අංශයේ (තාවකාලික) II වැනි ශ්‍රේණියේ සැලසුම්කරු තනතුරක් ඉල්ලීම**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   පෙලපත් නාමය (අගට යෙදෙන නම) :————.
   අනික් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) ලංකාවේ රට වැසියෙක් ද වග සඳහන් කරන්න:————.
   (i) පරම්පරාගත ලංකිකයෙක් ද, නැතහොත්,
   (ii) ලියාපදිංචි කරවා ගැනීමෙන් රටවැසිකම ලැබූ ලාංකිකයෙක් ද :————.
   (ආ) උපන් ස්ථානය—
   (i) අයදුම්කරු :————.
   (ii) අයදුම්කරුගේ පියා :————.
   (iii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (iv) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා:————.

   සංලක්ෂ්‍යය.—අයදුම්කරුත් ඔහුගේ පියාත් උපන්නේ ලංකාවේ නම් :
   (i) ත් (ii) ත් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු හෝ ඔහුගේ පියා හෝ උපන්නේ ලංකාවේ නොවේ නම් (i), (ii), (iii) හා (iv) ත් සම්පූර්ණ කළ යුතුය.

4. උපන් දිනය :————.
   1960 මැයි 13 වැනි දිනට වයස අවුරුදු :————, මාස :————, දවස් :————.

5. විවාහකද අවිවාහකද යන වග :————.

6. දැනට රක්ෂාවක් කරනවානම්, එය :————.

7. දැනට රක්ෂාවක් නැතිනම්, අන්තිමට යෙදුනු රක්ෂාව :————.

8. අධ්‍යාපන සුදුසුකම් :
   පොදු :————.
   පාසැල් :————.
   සමත්වූ විභාගය :————.
   කාර්මික :————.
   කොතන ලැබුවේද :————.
   සාමාර්ථ්‍යය ලැබූ විෂයයෝ:————.

9. හොඳින් දන්නා විෂයයනුත්, ඒවා එකිනෙක ගැන පළපුරුද්දත් කෙටියෙන් සඳහන් කරන්න :————.

10. පළපුරුද්දක් ඇත්නම් එය :————.

11. කිසියම් අපරාධයකට උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු නම් එය සඳහන් කර, දිනයත්, වරදත්, උසාවියේ නමත්, නඩු නොම්මරයත් දක්වන්න :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා සඳහන් කළ විස්තර සත්‍ය බව සහතික කරමි. කිසි දිනෙක රජයේ සේවයෙන් අකාර්යක්ෂමතාවය පිණිස විශ්‍රාම නොගැන්වූ හෝ සේවයෙන් පහකරනු නොලැබූ හෝ බවත් ප්‍රකාශකරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තර කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුව හොත් මා විසින්ම නුසුදුසු බවට පැමිණෙන වගද තෝරා ගැනීමට පසුව ඒබව දැනගන්නට ලැබුන හොත් කිසිම වන්දියක් නොලැබ රාජ කාරියෙන් පහකිරීමට මා භාජනය වන වගද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැලකිය යුතුයි.**—(අ) අයදුම්කරුගේ අත් අකුරෙන් කෙටියෙනුත්, නිවැරදිවත්, පැහැදිලිවත් පෝරමය සම්පූර්ණ කළ යුතුයි.

(ආ) ළඟදී ලත් සහතික තුනකට නොවැඩි ගණනක පිටපත් ඉල්ලුම් පතට ඇමිනිය යුතුය.

(ඇ) (තාවකාලික) II වැනි ශ්‍රෙණියේ සැලසුම්කරු යන්න ඉල්ලුම් පත බහා ලූ කවරයේ පිට සඳහන් කළ යුතුය.

---

## විභාග දෙපාර්තමේන්තුව

### දෙවෙනි ශ්‍රෙණියේ යන්ත්‍ර පරිචාරක (මැෂින් මයින්ඩර්) තනතුරක්

විභාග දෙපාර්තමේන්තුවේ දෙවෙනි ශ්‍රෙණියේ යන්ත්‍ර පරිචාරක (මැෂින් මයින්ඩර්) තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1960 මැයි මස 7 වැනි දිනට මත්තෙන් මට ලැබෙන සේ රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි.

2. **වැටුප.**—තනතුරට හිමි වාර්ෂික වැටුප රු. 1,086 න් පටන් ගෙන වර්ෂයකට රු. 42 බැගින් වර්ෂ එකොළහකින් වැඩි වී රු. 1,548 තෙක් නගී.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—මෙය විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරකි. මුල් අවස්ථාවේ දී මේ තනතුර අවුරුදු තුනක කාලයක ආධුනිකත්වයකට යටත් වේ. තෝරා ගත් අයදුම් කරු විශ්‍රාම වැටුප් සහිත ආණ්ඩුවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් හෙතෙම වැඩ බැලීමට පත් කරනු ලැබේ. තනතුර ස්ථිර කරනු නොලැබුව හොත්, ආණ්ඩුවේ සේවයෙන් පිටතින් බඳවා ගනු ලැබුවකුට සේවයෙන් අස්වීමට ද, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර සේවයේ නියුක්ත අයකුට මුලින් ඉසිලූ තනතුරට ආපසු යාමට ද සිදුවේ. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් උසුලන නිලධාරියෙක් මෙසේ ස්ථිර කරනු ලැබුවහොත් ඔහුට මුලින් ඉසිලූ තනතුරෙන් අස්වීමට සිදුවේ. පසුව එම තනතුරට ආපසු යාමට ද ඔහුට නොහැකි ය. තෝරා ගත් අයදුම්කරුට කෙටි කාලයක් තුළ දී පත්වීම භාර ගැනීමට සිදුවනු ඇත.

4. **සුදුසුකම්.**—පහත දක්වෙන සුදුසුකම් සෑම අයදුම්කරුවකුට ම ඇති බැව් පෙන්වීමට සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු යි :—

(අ) 1960 මැයි මස 7 වැනි දිනට වයස අවුරුදු 25 කට නොඅඩු ද 35 කට නොවැඩි ද බව (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව ක්‍රියාවේ නොයෙදේ) ;

(ආ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රය ලබා තිබෙන බව, එම සහතික පත්‍රය ලැබූ භාෂාවෙන් හැර අනික් භාෂා දෙකින් එකක් සම්බන්ධ යෙන් මනා දැනීමක් ඇති බව ;

(ඉ) මුද්‍රණ යන්ත්‍ර—අත් හා සවයංකාරී මුද්‍රණ යන්ත්‍ර—වැඩ කරවීම සම්බන්ධයෙන් පිළිගත් මුද්‍රණාලයක අවුරුදු 8 ක පළ පුරුද්දක් ඇති බව ;

(ඊ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

5. (i) අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්වලට පහත දක්වෙන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු යි. (මේවා ආපසු එවනු නොලැබේ.) :—

(අ) උප්පැන්න සහතික පත්‍රය ;

(ආ) අධ්‍යයනය/පිළිබඳව සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසි යෙන් හෝ ලත් උසස්ම සහතික පත් ;

(ඉ) මුද්‍රණ යන්ත්‍ර—අත් හා සවයංකාරී මුද්‍රණ යන්ත්‍ර—වැඩ කරවීම පිළිබඳව පිළිගත් මුද්‍රණාලයක අවුරුදු 8 ක පළපුරුද්දක් පිළිබඳ සාක්ෂ්‍යය පෙන්වන ලියකියවිලි ;

(ඊ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනට රාජ්‍ය සේවාවේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් චරිත සහතික පත්‍ර අනවශ්‍යය.)

(ii) තමාගේ චරිතය සහ මෙම තනතුරට ඇති සුදුසුකම් සම්බන්ධ යෙන් කරුණු අසා දැන ගත හැකි පුද්ගලයන් තුන් දෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කළ යුතු යි.

6. මේ සම්බන්ධයෙන් ඉල්ලුම් පත් හෝ වෙන යම් ලියුම් කියුම් හෝ එවිය යුත්තේ කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් යන ලිපිනයට විනා මගේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියකුගේ හෝ පෞද්ගලික ලිපිනයට නොවේ.

7. මේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡෙදයේ මුල පළ කරන ලද රාජ්‍ය සේවයෙහි තනතුරු වලට දේන පත්වීම් වලට අදාළ පොදු කොන්දේසි බැලිය යුතු ය.

8. ඉහත දක්වෙන කොන්දේසිවලට නොගැලපෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඊ. ආර්. පෙරින්පනායගම්,
විභාග කොමසාරිස්.

1960 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

### පූර්වෝක්ත ආදර්ශ ආකෘති පත්‍රය

**දෙවෙනි ශ්‍රෙණියේ යන්ත්‍ර පරිචාරක (මැෂින් මයින්ඩර්) තනතුරක් සඳහා එවන ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. දැන් උසුලන තනතුර සහ රාජකාරි ලිපිනය :————.

4. (අ) ඔබ—(i) පරම්පරාවෙන්,

(ii) ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසි බව ලැබුවෙක් දැයි සඳහන් කරන්න. (ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සඳහන් කරන්න) :————.

(ආ) පහත සඳහන් අයගේ උපන් ස්ථාන :—

(1) අයදුම්කරු :————.

(2) අයදුම්කරුගේ පියා :————.

(3) අයදුම්කරුගේ සීයා (පිය පාර්ශ්වයෙන්) :————.

(4) අයදුම්කරුගේ සීයාගේ (පිය පාර්ශ්වයෙන්) පියා :————.

5. උපන් දිනය :———— ; වයස :————.

6. (අ) අධ්‍යයන සුදුසුකම් (සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන්) :————.

(ආ) අයදුම්කරුට මනා දැනීමක් ඇති දෙවෙනි භාෂාව :————.

7. මුද්‍රණ යන්ත්‍ර—අත් හා සවයංකාරී මුද්‍රණ යන්ත්‍ර—වැඩ කරවීම සම්බන්ධයෙන් පිළිගත් මුද්‍රණාලයක කොපමණ කාලයක පළ පුරුද්දක් ලබා තිබේ ද යන වග :————.

8. ඔබේ චරිතය පිළිබඳ සහතික පත් දුන් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් :————.

9. ඔබ (i) රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙක් ද? :————.

නැතහොත් ඔබේ සේවය නවත්වන ලද ද? :————.

(ii) උසාවියකින් වරදකරුවකු කරන ලද ද? :————.

(iii) රාජ්‍ය සේවයෙහි කිසියම් රාජකාරියක් අත්හැර ගොස් තිබේ ද? :————.

10. අයදුම්කරුගේ චරිතය සහ එම තනතුරට ඔහුට ඇති සුදුසුකම් සම්බන්ධයෙන් පෞද්ගලිකව කරුණු කීමට දන්නා පුද්ගලයන් තුන්දෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

11. මෙම පත්වීමට කෙනෙකු තෝරා ගැනීමේ දී ඉවහල් විය හැකි වෙනත් විශේෂ සුදුසුකම් ඔබට ඇතොත් ඒවා සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### බාහිර උපදේශක තනතුරු—කණිෂ්ඨ කාර්මික විද්‍යාලය, ගාල්ල

ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ පහත සඳහන් විෂයයන් පිළිබඳ බාහිර උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ :—

1. ගණන් තැබීම (සිංහල-ඉංග්‍රීසි)
2. සිංහල (වෙළඳ සහ වෘත්තීය පංති)
3. ඉංග්‍රීසි (වෙළඳ පංති)

4. ලඝුලේඛනය (ඉංග්‍රීසි)

5. ටයිප් කිරීම (සිංහල සහ ඉංග්‍රීසි)

6. වාණිජ භූගෝල විද්‍යාව (සිංහල)

7. බිම් මැණීම සහ මට්ටම් කිරීම

8. ගණිතය.

ඉල්ලුම් පත්‍ර, ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ, විද්‍යාලයාධිපති තැන වෙත 1960 මැයි මස 12 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

අයදුම්කරුවන් තමන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා තමන්ගේ පළපුරුද්ද පිළිබඳව සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුයි. බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ප්‍රමාණය ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව වේ.

පත්වීම් සාමාන්‍යයෙන් අධ්‍යයන වර්ෂයකටය. එහෙත් උවමනා වූ විටක වර්ෂය ගතවන්නට පෙර වුවත් පත්වීම අවසාන කරන්නට හැකිය.

ප්‍රාරම්භ සහ වර්ෂයාවසාන පරීක්‍ෂණ වලදී අමතර ගාස්තුවක් නොමැතිව තම පන්තිවල ශිෂ්‍යයන් පරීක්ෂා කිරීම බාහිර උපදේශක වරුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

ආර්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂක වෙනුවට.

1960ක් වූ අප්‍රියෙල් මස 16 වැනි දින,
කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයීය
දෙපාර්තමේන්තුවේදීය.

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### බාහිර උපදේශක තනතුරු—ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ 10

කොළඹ 10යේ ලංකා කාර්මික විද්‍යාලයේ බාහිර උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර බාරගනු ලැබේ. 1960 මැයි මස 9වැනි දිනට හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ සියළුම ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි. අපේක්‍ෂකයන් විසින් තමන්ගේ අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් හා තමන්ගේ පළපුරුද්ද පිළිබඳව සියළුම විස්තර සඳහන් කළ යුතුයි.

**තනතුරු—**

**ඉංජිනේරු අංශය :** ජලනල සවිකිරීමේ පන්තිය (සෛද්ධාන්තික සහ ප්‍රායෝගික වැඩ),
විදුලි කම්බි සවිකිරීමේ පන්තිය (සෛද්ධාන්තික සහ ප්‍රායෝගික වැඩ)
මුද්‍රණ ශිල්පය (සෛද්ධාන්තික සහ ප්‍රායෝගික වැඩ).

**වෙළඳ අංශය : (සහතික පත්‍ර පන්ති)** ලඝු ලේඛනය සහ යතුරු ලියනය (ඉංග්‍රීසි සහ සිංහල)
වානිජ භූගෝල විද්‍යාව (ඉංග්‍රීසි සහ සිංහල)
වානිජ අංක ගණිතය (ඉංග්‍රීසි සහ සිංහල)
සිංහල භාෂාව

ඉංජිනේරු සහ වෙළඳ අංශවල බාහිර උපදේශක වරුන්ට ගෙවන ගාස්තු රුපියල් 5 සිට 15 දක්වා ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වේ.

**රක්‍ෂාවේ කොන්දේසි.**—මෙම තනතුරු අවුරුද්දේ ජූලි මාසයේදී පටන් ගෙන ඊලඟ අවුරුද්දේ මාර්තු මාසයෙන් අවසන් වේ.

බාහිර උපදේශක වරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්‍ෂණයන්හිද සහ අභ්‍යන්තර නොවූ පරීක්‍ෂකයන් නොයොදවන වර්ෂාවසාන පරීක්‍ෂණයන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන් පරීක්‍ෂා කළ යුතුයි.

ආර්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂක වෙනුවට.

1960 අප්‍රේල් මස 16 දින,
කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයීය
දෙපාර්තමේන්තුවේදීය.

---

අංකය : ට්. සී. සී. 2724.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි අත් වැඩ උපදේශිකා තනතුර

රජයේ අභ්‍යාස විද්‍යාලයන්හි පූර්වෝක්ත තනතුර සඳහා 1960 මැයි මස 13 වැනි දින තෙක් කොම්පොස්ඩ් වීදියේ, මලයි වීදියේ අධ්‍යාපන කාර්යාලයේ ට්. සී. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ :—

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය වූ කලී වර්ෂයකට රුපියල් 834—42—1,296කි.

3. **අවශ්‍ය අධ්‍යාපන හා අනික් සුදුසුකම්—**

(i) ඉල්ලුම්කරුවන් කාර්මික ගුරු සහතික පත්‍රය (කුඹල් කර්මාන්තය) හෝ ඊට සමාන තත්ත්වයේ අනික් කවර හෝ සහතික පත්‍රයක් ලබා කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් හෝ විභාගය කින් සමත්ව සිටිය යුතුය. ප්‍රතිරූපාදශී තැනීම ඇතුළුව කුඹල් කර්මාන්තය ඔවුන්ට ඉගැන්විය හැකි විය යුතුය. තවද, මෙහි පහත දක්වෙන කර්මාන්තද ඔවුන්ට ඉගැන්විය හැකිවිය යුතුය. පැදුරු ආදිය විවීම ඇතුළුව වට්ටි, පෙට්ටි විවීම, කොහු වැඩ, පොත් බැඳීම, සම් වැඩ හා කැට යම් වැඩ ;

(ii) 1960 මැයි මස 13 වැනි දිනට ඉල්ලුම් කරුවන් වයස අවුරුදු 22ට අඩු හෝ අවුරුදු 45ට වැඩි හෝ නොවිය යුතුය. රජයේ සේවයේ නියුක්ත වූ නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නොයෙදේ.

4. **විශේෂ කොන්දේසි—**

(i) තෝරාගනු ලබන ඉල්ලුම් කරු පළමුවරට උයන්වත්තේ රජයේ අභ්‍යාස විද්‍යාලයයට පත්කර යවනු ලබතත් ස්ථාන මාරු කර යැවීමට යටත්ය ;

(ii) මෙහි පහත ආදර්ශයක් දෙනු ලබන නියමිත ආකෘති පත්‍රයේ ලියා ඉල්ලුම් පත්‍ර එවිය යුතුය. ආකෘති පත්‍ර මේ කාර්යාල යෙන් සපයනු නොලැබේ. එහෙත් දැන්වීමෙහි දී තිබෙන ආදර්ශයෙන් ඉල්ලුම්කරුවන් විසින් ආකෘති පත්‍රය පිට පත් කර ගත යුතුය ;

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගැනීමට පෙර ගුරුවරියක වශයෙන් විශ්‍රාම වැටුප් හිමි ගුරු තනතුරක් දැරූ ගුරුවරියක තෝරා ගනු ලැබී නම්, ඇය මෙම තනතුර දරන තෙක් මෙය විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ප්‍රකාශ කර තිබෙන, රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන කොන්දේසිද බලනු මැනවි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙනුවට.

1960 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ පෝරමය

**උයන්වත්ත රජයේ අභ්‍යාස විද්‍යාලයේ අත්වැඩ උපදේශිකා තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. 1960.5.13 වැනි දිනට නිවැරදි වයස : අවුරුදු :——, මාස :——, දින :——.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය—
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඔහුගේ පියා :————.
(ඉ) ඔහුගේ පියාගේ පියා :————.
(ඊ) ඔහුගේ පියාගේ පියාගේත් පියා :————.

6. ලබාගත් දින සමඟ අධ්‍යාපනික සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය) : ————.

7. වෘත්තීය සුදුසුකම් :————.

8. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල (ඇතුළත් වූ හා අස්වූ දින සඳහන් කළ යුතුය) :————.

9. දැනට යෙදී සිටින රක්‍ෂාව :————.

10. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුලත් වූ දිනය | අස්වූ දිනය | දැරූ තනතුරු | සේවාකාලය අ. මා. ද. | අස්වීමට හේතුව |
| --- | --- | --- | --- | --- | --- |
| | | | | | |
| | | | එකතුව ... | | |

11. සිංහල භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.

12. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත් මුල් පිටපත් නොවේ, ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය).

13. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වූවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුනහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවද මම දනිමි.

————,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/60/7 (ජී).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1959 යේ මාර්තු

වර්ෂ 1960 ක් වූ මාර්තු මස 18 වැනි දිනය හා අංකය 12,087 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, වර්ෂ 1960 ක් වූ මාර්තු මස 12 වැනි දිනය දරණ නිවේදනය හා සම්බන්ධයි. වර්ෂ 1959 ක් වූ මාර්තු මස 28 වැනි දින පවත්වනු ලැබූ ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කර ගැනීමට තෝරා ගනු ලැබූ බැව් මෙයින් දන්වමි.

| නම | ලිපිනය |
|---|---|
| ද සිල්වා, කේ. ඩී. | "ශාන්ති" මුල්ලපිටිය, බේරුවල |
| පෙරේරා, ආර්. ඒ. එම්. | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 22, ජීඩ් මාවත, කොළඹ 7. |
| සූරවීර, අයි. එස්. (මෙනෙවිය) | ලංකා ගුවන් විදුලි කාර්යාලය, කොළඹ 7. |

2. ඉහත සඳහන් අපේක්ෂකයින්ට සහ අපේක්ෂිකාවට පත්වීම් වහාම දීමට ආණ්ඩුව භාරගන්නේ නැත. නමුත් ඇබෑර්තු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. අපේක්ෂකයන් තුන් අවුරුදු අස්ථිර පත්වීම් ඇතිව ද, අපේක්ෂිකාව තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවක් සහිතව ද පත් කෙරෙනු ඇත. සියළු අපේක්ෂක අපේක්ෂිකාවන් විසින්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සාමර්ථය ලැබිය යුතුයි. තවද, ඔවුන් ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### බානගල චාරිකා බංගලාවක් තැනීම සඳහා ටෙන්ඩර්

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් මාතර දිස්ත්‍රික්කයේ බානගල යන ගමෙහි චාරිකා බංගලාවක් තැනීම සඳහා ටෙන්ඩර් 1960 මැයි මස 20 වෙනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි පෝරමයක අනු පිටපතකුත් සමග තමාගේ ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුයි. සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවාක්මෙන්ම, කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයෙහි පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයේදි සැලැස්මද පරීක්‍ෂා කළ හැක.

3. ටෙන්ඩර් පෝරම 1960 මැයි මස 16 වෙනි දින දාවල් 12 දක්වා පමණක් නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැණීමට මත්තෙන් ඉඩම් සංවර්ධන කායසීලයෙහි හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාගී දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු නොවූ මුදලකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ටෙන්ඩර් පත්‍ර දෙනු ලැබේ.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ.

1960 අප්‍රියෙල් මස 11 වෙනි දින,
කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයේ පිහිටි,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් මොණරාගල වාරිමාගී උප කොට්ඨාශයේ දොඹගහවෙල ඕවර්සියර් නිවාසයක් සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 60.5.18 වෙනි දින පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් සමන්විත වියයුතුයි. අවශ්‍ය පෝරම මොනරාගල උප කොට්ඨාශ භාර වාරිමාගී නිලධාරි තැනගෙන් ලබාගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබාගත හැකි අතර මේ සඳහා ඇති සියලුම සැලසුම් ඔහුගේ කායසීලයේදී පරීක්‍ෂාකළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පුකළ හැකි හා රුපියල් 25 කච්චේරියක හෝ මොණරාගල වාරිමාගී කායසීලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අය වළුන්ට පමණක් 60.5.17 වෙනි දින තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරණු ලැබේ.

උ. කො. භා. වා. මා. නිළධාරිතැන.
මොණරාගල වා. උ. කො.
2. 4. 60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකවැරටිය උප කොට්ඨාශයේ තුඹුල්ල මහ වැවේ වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 මැයි මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර හා මේ පිළිබඳ වැඩි විස්තර නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් 1960 මැයි මස 2 වෙනි සඳුදා දක්වා ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් විසින් නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියක මෙම වැඩය සඳහා රුපියල් 50ක මුදලක් තැන්පත් කළ බවට රිසිට් පත් ඉදිරිපත් කළ යුතුය.

ඇල්. බී. ඇම්. ප්‍රනාන්දු,
නිකවැරටිය උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය, 1960.4.2.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකවැරටිය උප කොට්ඨාශයේ මහනාන්නේරිය වැවේ මහ ඇළේ ජල ගැලීමෙන් සිදුවූ හානි අලුත්වැඩියා කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000 කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර හා මේ පිළිබඳ වැඩි විස්තර නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් 1960 මැයි මස 16 වෙනි සඳුදා දක්වා ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම වැඩය සඳහා නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියක රුපියල් 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

ඇල්. බී. ඇම්. ප්‍රනාන්දු,
නිකවැරටිය උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය,
1960. 4. 7.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් උඩුවෙල ව්‍යාපාරයෙහි දකුණු පස මහ ඇල සහ සාමාන්‍ය වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000කට හෝ ඊට වැඩි වශයෙන් ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් මැයි මස 17 වෙනි දින දහවල් 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මැයි මස 9 වෙනි දින සිට 14 වෙනි දින දක්වා දෙදිනම ඇතුළුව කාර්යාලීය වේලාවන්හිදී ටෙන්ඩර් පත්‍ර පහත අත්සන් කරන මා විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පෙර එක ටෙන්ඩරයක් වෙනුවෙන් රුපියල් 25ක් කච්චේරියක හෝ මෙම කාර්යාලයේ හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී සටහන් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන් ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
ගාළු උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 1960.4.7.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොළඹ ආයතනවලට 1960.9.30න් අවසන් වන කාලය තුළ දී අළුත් මාළු සැපයීම පිණිස කොළඹ නගරයේ මාළු වෙළඳුන්ගෙන් පමණක් ටෙන්ඩර් 1960 මැයි මස 16 වැනි සඳුදා අපරභාග 2.30 දක්වා කොළඹ, කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62, දරන ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් 1960.5.16 වැනි දින දවල් 12 වනතුරු ලබාගත හැකි ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. වැඩි විස්තර කොළඹ, කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගත හැක.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960.4.18 වැනි දින,
කොළඹ 1, චැතැම් වීදියේ,
අංක 62 දරණ ස්ථානයේ පිහිටි,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1960 මැයි මස 13 වෙනි සිකුරාද පෙරවරු 10.30 වන තෙක් මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| (1) මා/ඉමාදුව සි. මි. පා. | ... | පාසැල් ගොඩනැගිලි ආදිය |
| (2) මහ/මාරස්සන දෙ. පා. | ... | ඉතිරි වැඩ නිමකිරීම |
| (3) මහ/වරදිවල ජ්‍යෙ. පා. | ... | අලුත් වැඩියාව |
| (4) මහ/පේරාදෙණිය ප්‍රාථමික | ... | අලුත් වැඩියාව |
| (5) නු/මැතිබැමිය සි. මි. පා. | ... | අලුත් වැඩියාව |

සංලක්ෂ්‍යය : මහ = මහනුවර.
නු = නුවරඑළිය.
මා = මාතලේ

2. ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත් කරුවන් අංක 1 සඳහා රු. 15,000ට නොඅඩු ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 7,500ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, අංක 2 සිට 4 දක්වා වූ වැඩ සඳහා රු. 10,000ට නොඅඩු ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 5,000ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, අංක 5 සඳහා රුපියල් 5,000කට නොඅඩු ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 2,500ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී සිටිය යුතුයි.

3. තවද, අනුමත කරනලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටිත් නම් එම සමිතිවලටද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. එකී සමිති ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී නැත්නම් අංක 1 සඳහා රු. 15,000ට නොඅඩු ගණනකටද, අංක 2 සිට 4 දක්වා වූ වැඩ සඳහා රු. 10,000ට නොඅඩු ගණනකටද, අංක 5 සඳහා රු. 5,000ව නොඅඩු ගණනකටද, ගොඩනැගිලි වැඩ කිරීමේ හැකියාවක් තිබෙන බවට සහතික කරන ලද ලියකියවිලි, සමුපකාර සමිති සඳහා නම් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමාගෙන් ද, ග්‍රාම සංවර්ධන සමිති සඳහා නම් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් ද, කම්කරු සමුපකාර සමිති සඳහා නම් කම්කරු කොමසාරිස් තුමාගෙන් ද, ලබාගෙන මධ්‍යම පලාතේ අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. වර්ෂ 1960 මැයි මස 12 වෙනි බ්‍රහස්පතින් ද දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් ද තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි මහනුවර අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුයි. චැක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වවුචර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන නිලධාරි තැන ගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වවුචර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන 2 වන හා 3 වන ඡේදයන්හි සඳහන්වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා සමිතිවලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 වන ඡේදයන්හි දැක්වෙන පරිදි මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්මවල් ද එහිදී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් මහනුවර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. වර්ෂ 1960 මැයි මස 13 වෙනි සිකුරාද පෙරවරු 10.30ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර් කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරාගැනීමට සෑම උත්සාහ යක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

ජී. එච්. බී. ඒකනායක,
ම. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
මහනුවර, 1960, අප්‍රියෙල් මස 16 දින.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව — සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 මැයි මස 17 වැනි බදාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

(1) හල්තොට දිස්පැන්සරියට ළිඳක් කැනීම (කළුතර දිස්ත්‍රික්කය.)

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 මැයි මස 13 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 10,000 වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගත්තටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂාකර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ: පෙ: 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිළධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
වැඩ බලන ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ: පෙ: 1434,
කොළඹ 7.
දිනය :— 18.4.60

---

## මීගමුවේ තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට 1959-60 ආදායම් වර්ෂයේ ඉතිරි කොටස තුළ වියලි පොල් ඉරට සැපයීම

1959-1960 ආදායම් වර්ෂයේ ඉතිරි කාලය තුළ මීගමුවේ තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට වියළි පොල් ඉරට සැපයීම සඳහා මෙහි පහත අත්සන් කරන අය විසින් 1960 මැයි මස 13 වැනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සඳහා රුපියල් 25ක මුදලක් තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරි තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මුද්‍රණය කරන ලද ටෙන්ඩර් ෆෝර්ම පහත අත්සන් කරන අයගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් සැලකිය යුත්තක් නම් තමා නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරින් හා ඉලක්කමෙන් දැක්වීමයි. එසේ අකුරින් හා ඉලක්කමෙන් සඳහන් නොවූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

1960 මැයි මස 13 වැනි දින පෙරවරු 9.35ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එකී වේලාවේදී කැමති ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවීමට නොසතුටු ටෙන්ඩර් කරුවන් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින්, පිටත මුද්‍රා සහිත නම, ලිපිනය සහ සේවයද සඳහන් කොට ටෙන්ඩර් පත්‍ර පෞද්ගලිකවම ඒ සඳහා බලය ලත් නිලධාරියෙකුට භාර දීමෙන් කුවිතාන්සියක් ලබාගත හැක.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත යුතුයි.

ඊ. ඒ. ඇස්. ඩබ්ලිව් පෙරේරා,
තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස
විද්‍යාලයේ අධිකාරි.

1960 අප්‍රේල් මස 22 වෙනි දින,
මීගමුව.

## 1959-60 වර්ෂයේ මහර බන්ධනාගාරයට දෙවෙනි කොහු හා ගුදිරි කොහු සැපයීම

පහත අත්සන් කරන ලද අය විසින් රාගම, මහර බන්ධනාගාරයට භාරගත් දින සිට 1960 සැප්තැම්බර් මස දක්වා කාලය තුළ දෙවෙනි කොහු හා ගුදිරි කොහු සැපයීම සඳහා 1960 මැයි මස 6 වෙනි සිකුරාද පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

(අ) දෙවෙනි කොහු හා ගුදිරි කොහු සඳහා අය කරන මිළ ගණන් වෙන වෙනම එකම ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුයි;

(ආ) මුද්‍රා තබන ලද සැම්පල් වෙන වෙනම මහර බන්ධනාගාරයේ අධිකාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර පමණක් ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

පහත අත්සන් කළ අය වෙත ඉල්ලුම් පතක් ඉදිරිපත් කිරීමෙන් ලබා ගන්නා මුද්‍රිත පත්‍ර වල ටෙන්ඩර් සඳහන් කළ යුතුයි. රුපියල් 10ක් මහර බන්ධනාගාර කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ඉල්ලුම් පතක් ලබාගත හැක. නියම කරණ මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් සහ අංක වලින් දැක්විය යුතුයි.

දෙවෙනි කොහු හා ගුදිරි කොහු සැපයීම සඳහා රෙජිස්ටර් තැපැලෙන් එවන හෝ මහර බන්ධනාගාරයේ තබා තිබෙන ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කරන සියලුම ටෙන්ඩර් පත්‍ර ඇතුළත් කවරයේ දකුණු කෙළවරේ ඉහළ **"දෙවෙනි කොහු හා ගුදිරි කොහු සැපයීම"**, කියා සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ නියමිත වේලාව ඉකුත්වූ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පැමිණිය හැක.

ඊ. ඇල්. ප්‍රනාන්දු,
අධිකාරි තැන.

මහර බන්ධනාගාරය,
රාගම, 14. 4. 60.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### විකුණුම් දැන්වීමයි

පහත පෙනෙන පරණ (පාවිච්චි කරන ලද) වාහන මිලට ගැනීම සඳහා එවන සීල්තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 අප්‍රියෙල් මස 29 වෙනිද වන සිකුරාද පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ:—

1. **මෝටර් රථ :**

1 ශ්‍රී 5031 වෙනි පෝඩ් ශීපර් රථය
EN 9879 වෙනි පෝඩ් ශීපර් රථය
EN 9709 වෙනි පෝඩ් ශීපර් රථය
EY 5414 වෙනි මර්සිඩිස් බෙන්ස් රථය
EL 8749 වෙනි ජේපාක්ස් වැගන් රථය
EL 8750 වෙනි ජේපාක්ස් වැගන් රථය

2. 1 ශ්‍රී 1177 වෙනි ලෑන්ඩ් රෝවරය රථය

3. **වෑන් රථ :**

1 ශ්‍රී 7542 වෙනි ජේපාක්ස් වැගන් කොම්බි රථය

4. **මෝටර් බයිසිකල් :**

EL 363 වෙනි සන්බීම් බයිසිකලය
EL 909 වෙනි සන්බීම් බයිසිකලය
EN 8892 වෙනි ට්‍රයම්ප් ටයිගර් කබ් බයිසිකලය
EL 1076 වෙනි ට්‍රයම්ප් බයිසිකලය
EN 7089 වෙනි ජාවා බයිසිකලය

1 සිට 3 දක්වාවූ රථ වෙනුවෙන් **එකකට** රු. 100 බැගින්ද, මෝටර් **සයිකලයකට** රු. 50 බැගින්ද ටෙන්ඩර මුදල් තැන්පත් කළ යුතුයි.

කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය ටෙන්ඩර පත්‍රයට ඇමිණිය යුතුයි. මේ තැන්පත් මුදල් ආපසු ලබාගත හැකියි. **"පාවිච්චි කරන ලද වාහන සඳහා එවන ටෙන්ඩර පත්‍රය"** යන මේ පාඨය කවරයේ වම් කෙළවර මුදුනේ පැහැදිලිව සඳහන් කළ යුතුයි. පිළිගන්නා ලබන ටෙන්ඩර කරුවන් විසින් සම්පූර්ණ මුදල ගෙවා දවස් පහක් ඇතුළතදී වාහන හැරගෙන යාමට පිළියෙල කරගත යුතුයි.

ඉහතකී වාහන 1960 අප්‍රියෙල් මස 25 වෙනි, 26 වෙනි, 27 වෙනි දිනවල පෙ. ව. 9 ත් ප. ව. 4 ත් අතර කාලයේදී බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ඉන්ජිනේරු

කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකිය. වේරහැර (රථවාහන පිළිබඳ) නියෝජ්‍ය ප්‍රධාන ඉන්ජිනේරු මහතාගෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් තැන.

1960 අප්‍රියෙල් මස 8 වෙනි දින,
කොළඹදීය.

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරියා විසින් කොළඹ පාසන් පාරේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන කාර්යාලයේ දී, මෙහි පහත සඳහන් විස්තර පරිදි කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදා ස්ථානයේ තිබෙන වඩු යන්ත්‍ර දෙකක් උදෙසා ධූලි උද්ධරණ යන්ත්‍රාගාරයක් (Dust Extraction Unit) සැපයීම සහ පිහිටුවීම සඳහා 1960 මැයි 6 දින පෙරවරු 9.30 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) ආවෘත්තිය ධූලි සංග්‍රාහයකයක් (Cyclone dust collector) සහිත වෝල්ට් 400, සන්ධි 3, ආවර්ත 50 කට සුදුසු දුම් පිට කරන හුලං පෙති යන්ත්‍රාගාරයක් (Motorised Exhaust Fan Unit) සැපයීම.

(2) අවශ්‍ය දුම් නළ සහ දුම් නළ වැසුම් ද වඩු යන්ත්‍ර දෙකට යෝග්‍ය වූ ආධාරක පටි ද ඇතුළුව දුම්පිට කරන හුලං පෙති යන්ත්‍රාගාරය සහ ආවෘත්තිය ධූලි සංග්‍රාහකය ඉසිලීමට උවමනා ආධාරක වානේ නිර්මාණයක් සැපයීම.

(3) වඩු යන්ත්‍ර දෙකට ධූලි උද්ධරණ යන්ත්‍රයක් වන සේ එම භූමි භාගයේ හුලං පෙති යන්ත්‍රයක් ද ආවෘත්තිය නළ සහ වානේ නිර්මාණය පිහිටුවීම.

2. කොළඹ, පාසන් පාරේ, ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියාගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. කවර ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථමයෙන් සිවිල් පාලක නිලධාරියා වෙත රු. 50ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම බලා ගැනීම සඳහා 1960 මැයි 6 දින පෙ. ව. 9.30 ගුවන් හමුදා ප්‍රධාන කාර්යාලයට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැකිය.

ජේ. ඇල්. බාකර්,
(ගුවන් උප-මාර්ෂල්),
ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියා.

1960. 4. 22.

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ටැලිපෝන් කණු ගෙනයාම සහ බෙදා හැරීම

දළ වශයෙන් ටොන් 35, හො. 7, කා. 2, රා. 15ක් බරැති රේල්පීලි 165ක් බදුල්ලේ දුම්රිය ස්ථානයේ සිට මාපකඩවැව දක්වා සැතපුම් 55½ක් ගෙනයාමටත් ඒවා මාපකඩවැව සිට අළුත්නුවර දක්වා සැතපුම් 5½ක් තුළ දළ වශයෙන් යාර 60 න් 60 ට බෙදා හැරීම සඳහා මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැන විසින් 1960 මැයි මස 20 වෙනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් තැන වෙත හෝ කොළඹින් බැහැර නම් තැපැල් ස්ථානාධිපති වෙත හෝ රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ කල්හි කොළඹ, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝරමවල ලියා අනුපිටපත් සහිතව ටෙන්ඩර් එවිය යුතුවේ.

ටෙන්ඩර් පෝරම 1960 මැයි මස 19 වෙනි දින පස්වරු 4.00 දක්වා නිකුත් කරනු ලැබේ.

කොන්ත්‍රාත්තුව යථා පරිදි අවසන් කිරීම සඳහා ගිවිසුමකට අත්සන් තැබීමට අවශ්‍ය වුවහොත් ඇපකරුවන් දෙදෙනෙකු තම වියදමින් ඉදිරිපත් කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ.

කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකිරීම සඳහා ඇප වශයෙන් ටෙන්ඩරයේ වටිනාකමින් 5කට සමාන මුදලක් පෝස්ට්මාස්ටර් ජනරාල් නමින් තැන්පත් කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව බැඳෙන විට ඔහු විසින් මුද්දර ඇඳො පනත යටතේ ගිවිසුම් පත්‍රයට මුද්දර ඇලවිය යුතු වේ.

ටෙන්ඩර් භාරගත් දින සිට යටත් පිරිසෙයින් දින හැටක් (60) ගතවන තුරු ටෙන්ඩර් සියල්ලක්ම වලංගුව තිබිය යුතුය.

1960 මැයි මස 20 වෙනි දින පෙරවරු 10.00 ට ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ. 9.4.1960.

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ටැලිපෝන් කණු ගෙනයාම සහ බෙදා හැරීම

දළ වශයෙන් ටොන් 111 හො. 9 කා. 3 රා. 18ක් බරැති රේලිපීලි 540ක් බදුල්ලේ දුම්රිය ස්ථානයේ සිට බිබිල දක්වා සැතපුම් 37ක් ගෙනයාමටත් ඒවා බිබිලේ සිට පදියතලාව දක්වා සැතපුම් 18 ක් තුළ දළ වශයෙන් යාර 60 න් 60 ට බෙදා හැරීම සඳහා මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැන විසින් 1960 මැයි මස 20 වෙනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් තැන වෙත හෝ කොළඹින් බැහැර නම් තැපැල් ස්ථානාධිපති වෙත හෝ රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ කල්හි කොළඹ, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝරමවල ලියා අනුපිටපත් සහිතව ටෙන්ඩර් එවිය යුතුවේ.

ටෙන්ඩර් පෝරම 1960 මැයි මස 19 වෙනි දින පස්වරු 4.00 දක්වා නිකුත් කරනු ලැබේ.

කොන්ත්‍රාත්තුව යථා පරිදි අවසන් කිරීම සඳහා ගිවිසුමකට අත්සන් තැබීමට අවශ්‍ය වුවහොත් ඇපකරුවන් දෙදෙනෙකු තම වියදමින් ඉදිරිපත් කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ.

කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකිරීම සඳහා ඇප වශයෙන් ටෙන්ඩරයේ වටිනාකමින් 5%කට සමාන මුදලක් පෝස්ට්මාස්ටර් ජනරාල් නමින් තැන්පත් කිරීමට තෝරාගත් ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව බැඳෙන විට ඔහු විසින් මුද්දර ආඥා පනත යටතේ ගිවිසුම් පත්‍රයට මුද්දර ඇලවිය යුතු වේ.

ටෙන්ඩර් භාරගත් දින සිට යටත් පිරිසෙයින් දින හැටක් (60) ගතවන තුරු ටෙන්ඩර් සියල්ලක්ම වලංගුව තිබිය යුතුය.

1960 මැයි මස 20 වෙනි දින පෙරවරු 10.00 ට ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ, 9.4.1960.

---

## තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු තැපැල් වෑන් රථ මිලට ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර—ප්‍රධාන තැපැල් කාර්යාලීය ගමනාගමන සේවය

සේවයට නුසුදුසු පහත සඳහන් තැපැල් වෑන් රථ මිලයට ගැනීම සඳහා 1960 මැයි 31 වැනි දින පෙරවරු 10 දක්වා කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| | |
|---|---|
| 1. මොරිස් කොමර්ෂල් තැපැල් වෑන් රථය | සීවයි. 7990 |
| 2. " " " | සීවයි. 7992 |
| 3. " " " | සීවයි. 7995 |
| 4. " " " | සීවයි. 7988 |
| 5. " " " | සීවයි. 7989 |
| 6. ඔස්ටින් තැපැල් වෑන් රථය | සීවයි. 9605 |
| 7. " " | සීවයි. 7987 |
| 8. පෝර්ඩ්සන් තැපැල් වෑන් රථය | සීඇල්. 4624 |
| 9. " " | සීඇන්. 673 |
| 10. " " | සීඇල්. 4625 |
| 11. " " | සීඇන්. 2413 |

සම්පූර්ණ විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ කොටස I, ඡේදය II, දැන්වීම් (ඉංග්‍රීසි) බලන්න.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ, 12. 4. 1960.

---

## විදුලිබල මාර්ග අමතර උපකරණ සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960 ක් වූ ජූනි මස 22 වන බදාදා දවල් 12 දක්වා ප්‍රවාහණ සහ බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් බාරගනු ලැබේ.

තෝරා පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් දින (10) දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත් කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුට විරුද්ධව නීති මගින් හෝ වෙනත් ක්‍රමයකින් කටයුතු කිරීමේ බලය ඇතිව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

(5) 1960 අප්‍රියෙල් මස 30 වෙනි දින දවල් 12ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. ඉල්ලුම් කරුවනට කැමතිනම් මේ අවසථාවේදී පැමිණිය හැක.

(6) නියමිත ෆෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන් වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

(7) ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

(8) යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කොළඹ දිසාපති වෙත තබාගනී.

(9) පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම් පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

(10) 1934ජේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙද) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

(11) කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපින යට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නාකොට සැලකිය යුතුයි.

(12) වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

(13) වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම් ඇතුලත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කොළඹ දිසාපතිතුමා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

(14) ටෙන්ඩර්කරුවන් ඔවුන් සඳහන් කරණ ලද මිල ගණන් පිට ටෙන්ඩර් බාර ගන්නාලද අවසාන දිනයේ සිට සති (3) තුන ඇතුලතදී ටෙන්ඩරය බාරගැනීම බලාපොරොත්තු විය යුතුයි.

(15) පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුලත පොල්වලට ගෙවා ඉවත්කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩදෙනු නොලැබේ.

(16) මේ පිළිබඳ වැඩිවිස්තර කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැනගෙන් හෝ මීගමුවේ ප්‍රාදේශීය ආදායම් පාලක තැනගෙන් දැන ගත හැක.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1960 අප්‍රියෙල් මස 14 වෙනි දින,
කොළඹ කච්චේරියේදීය.

---

## කොටියාගල ගොවිජනපදයේ ගෙවල්වල පියසි අළුත්වැඩියා කිරීම

මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් 1960 මැයි මස 9 වැනි දින දහවල් 12 දක්වා කොටියාගල ගොවිජනපදයේ ගෙවල්වල පියසි අළුත්වැඩියා කිරීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 10ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 මැයි මස 5 වැනි දින දහවල් 12 දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සුරක්ෂිත ලෙස සීල් තබා ලියුම් කවරයේ "කොටියාගල ගොවිජනපදයේ ගෙවල්වල පියසි අළුත්වැඩියා කිරීම" යනුවෙන් සඳහන්කොට මොණරාගල කච්චේරියේ දිසාපති තැන නමට එවිය යුතුයි. ටැන්ඩර් පත්‍ර ලියා පදිංචි කිරීමේ තැපැලෙන් එවිය හැකිය. එසේ නැත්නම් කායසීලිය සහකාර තැන ළඟ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකිය.

කරුණු රහිතව ටැන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැන වෙත පැවරේ.

වී. පී. සිල්වා,
මොණරාගල දිසාපතිතැන
වෙනුවට.

1960 අප්‍රේල් මස 6 දින,
මොණරාගල,
කච්චේරියේදීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කන්තලේ තානායම අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ත්‍රිකුණාමලේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 4. 18.

---

කැබිතිගොල්ලෑවේ ආණ්ඩුවේ සිංහල මිශ්‍ර පාඨශාලාවේ කසල සේදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මැදවච්චිය ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 16,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක්: "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 4. 18.

---

බලපිටියේ මහෙස්ත්‍රාත් උසාවි ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදද පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ඇල්පිටියේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක්: "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 4. 18.

---

හම්බන්තොට අළුත් ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ ඉතිරි වැඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදද පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හම්බන්තොට ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක්: "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 4. 18.

---

ඇල්ල තානායමේ මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම සහ ජනේල සෑපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදද පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. බදුල්ලේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක්: "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 4. 18.

---

පුත්තලමේ විධායක ඉංජිනේරු කාර්යාලය සහ ගබඩාව අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදද පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පුත්තලමේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 6 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක්: "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේදීය, 1960. 4. 18.

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ජාතික නිවාස දෙපාර්තමේන්තුව

#### මහලියද්ද නිවාස යෝජනා ක්‍රමය—බදුල්ල

1960 මාර්තු 18 දින පළ වූ දැන්වීම අනුව ඉහත සඳහන් නිවාස යෝජනා ක්‍රමයේ නිවාස සඳහා ඉල්ලුම් පත් භාරගැනීමේ දිනය 1960 මැයි 6 දා තෙක් දීර්ඝ කරන ලදී.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස්.

තැ. පෙ. 544,
කොළඹ 2.

## විශේෂ නිවේදනයයි

1960 මැයි 10 වැනි අඟහරුවාදා සහ 11 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 මැයි 13 වැනි දා නිකුත් කරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 මැයි 6 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 අප්‍රේල් 9 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.